**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී II වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026**

1.0 සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2015.01.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන ලද සබරගමුව පළාත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණය (පරිවාස නිලධාරී) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව **පරිවාස නිලධාරී II වැනි ශ්‍රේණියේ** තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ සාමාන්‍ය පරීක්ෂණයකින් අනතුරුව මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන අතර, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විභාගය පැවැත්වෙන දිනය යථා කාලයේදී දන්වනු ඇත. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90හි විධිවිධානයන් පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් දෙකෙහි කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිලධාරී II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 මෙම විවෘත තරඟ විභාගය මගින් සම්පූර්ණ කරනු ලබන **පුරප්පාඩු සංඛ්‍යාව 05** කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

4.0 වැටුප : අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව **පරිවාස නිලධාරී II වැනි ශ්‍රේණියට** අදාළ වැටුප් කාණ්ඩය MN 5 - 2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 58,660 - 10×1,190 - 11×1,360 - 15×1,670 - රු.110,570/- වේ. මෙයට අමතරව රජයේ නිලධාරීන්ට රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද මෙම තනතුර දරන්නාට හිමි වනු ඇත.

5.0 **සුදුසුකම් :- සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිලධාරී II වැනි ශ්‍රේණියේ** තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) අධ්‍යාපන සුදුසුකම් :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව, සමාජ වැඩ පිළිබඳ උපාධිය, අපරාධ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව යන විෂයයන්ගෙන් විශේෂ උපාධියක් ලබා තිබීම හෝ ඉහත විෂයයන්ගෙන් එකක් හෝ කිහිපයක් ඇතුළත්ව උපාධියක්, පංති සාමාර්ථයක් සහිතව ලබා තිබීම.

(ආ) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය වන යහපත් මානසික හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඇ) වෙනත් සුදුසුකම් :
1) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
3) 2026.07.30 දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

සටහන : සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.07.30 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

## 6.0 ලිඛිත විභාගය :

මෙම ලිඛිත විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර, ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| විෂයය | ලකුණු | කාලය |
|---|---|---|
| 1) අභියෝග්‍යතා පරීක්ෂණය | 100 යි | පැය 01 යි |
| 2) සාමාන්‍ය දැනීම | 100 යි | පැය 01 යි |

ඉහත විෂයයනට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ හා කෙටි පිළිතුරු සහිත ප්‍රශ්න පත්‍රයකි. |
| සාමාන්‍ය දැනීම | ජාතික හා ජාත්‍යන්තර, සමාජ ආර්ථික, දේශපාලන තොරතුරු ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සහිත ප්‍රශ්න පත්‍රයකි. |

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) අපේක්ෂකයකු විසින් ලබාගත යුතුවන අතර, පවතින පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

## 7.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1200/- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. **එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය.** ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

## 8.0 අයදුම්පත්‍ර :

ඒ 4 (සාමාන්‍ය භාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,
(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් තම අත් අකුරින්ම පැහැදිළිව අයදුම්පත්‍රය පිරවිය යුතුය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳවා ගැනීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ.

8.2 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

8.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2027.07.30 වන දිනට හෝ ඊට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිලධාරී II වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

9.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
III. වලංගු රියදුරු බලපත්‍රය.

10.0 **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. එසේම අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2026.06.30.

**ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත**

ආදර්ශ අයදුම් පත්‍රය

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිලධාරී II වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

**Open Competitive Examination for the Recruitment to the post of Probation Officer - Grade II in the Sabaragamuwa Provincial Public Service - 2026**

---

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2 දෙමළ - 3
( කොටුව තුළ අදාළ අංකය ලියන්න) [ ]

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටීම සඳහා කැමති නගරය : රත්නපුර - 01 කෑගල්ල - 02 [ ] ( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

1.0 1.1 මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමඟ නම .........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම .........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම .........................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

1.5 දුරකථන අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

2.0 2.1 ස්ථිර ලිපිනය .........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ...........................................................................

2.2 ස්ථිර ලිපිනය .........................................................................................
(සිංහලෙන් / දෙමළෙන්) ...........................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ...........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ...........................................................................

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :...............................
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :...............................
3.3 පදිංචිව සිටින කාලසීමාව : ...................................
3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ...................................

4.0 4.1 ස්ත්‍රී / පුරුෂ භාවය ස්ත්‍රී - 1 පුරුෂ - 0 [ ] (කොටුව තුළ අදාළ අංකය ලියන්න)

4.1 උපන් දිනය: වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දින [ ][ ]

4.2 2026.07.30 වන දිනට වයස: අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

5.0 අධ්‍යාපන සුදුසුකම්

I. ලබා ඇති උපාධිය, විෂයයන් සහ පංති සාමාර්ථය : ..........................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

II. එම සහතිකය වලංගු දිනය..........................................................................

III. උපාධිය ලබා ඇති විශ්ව විද්‍යාලයේ / ආයතනයේ නම.....................................
..........................................................................................................

( ලබා ඇති උපාධි සහතිකයේ පිටපතක් අමුණන්න. )

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :..........................................................

(ii) ලදුපතේ අංකය හා දිනය :..........................................................

(iii) ගෙවූ මුදල :..........................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

8.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.......................................... ..........................................
දිනය අයදුම්කරුගේ අත්සන

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන.......................................................... මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී .......................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.......................................... ....................................................

දිනය සහතික කරන අයගේ අත්සන

සහතික කරන අයගේ සම්පූර්ණ නම : ..........................................................................
තනතුර : .............................................
ලිපිනය : .............................................
( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න )

10.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියකු විසින් කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ .................................................................. දින සිට ........................................................................... තනතුරේ සේවය කරන ..............................................................................................................මහතා / මහත්මිය / මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු / ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

..............................................................
දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියා හෝ බලය පවරනු ලබන නිලධාරියාගේ අත්සන

නම : .....................................................
පදවිය : ...............................................
දිනය : ...................................................
දෙපාර්තමේන්තුව / ආයතනය : ...................
(නිල මුද්‍රාව තබන්න)